Annex

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2015

මගේ අංකය: EST 5/1/49
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2015.02.11

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්

## 2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ නිලධරයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ දීමනා සංශෝධනය කිරීම

"2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය අංශයේ නිලධරයන් සහ විශ්‍රාමිකයන් සඳහා අන්තර් දීමනා ගෙවීම" යන මැයෙන් නිකුත් කරන ලද 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2014 හා 2014.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2014 (I) කෙරෙහි අවධානය යොමු කරවමි.

**02.** ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධරයන්ට දැනට ගෙවනු ලබන රු. 3000/- ක මාසික අන්තර් දීමනාවට අමතරව 2015 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි තවත් රු. 5000/- ක් දීමනාවක් ලෙස ගෙවිය යුතුය. රාජ්‍ය අංශයේ නිලධරයන්ට ගෙවීමට යෝජිත මාසික රු. 10000/- දීමනාවෙන්, ඒ අනුව ගෙවිය යුතු ඉතිරි මුදල වන රු. 2000/-, 2015 ජුනි මස සිට ගෙවීමට කටයුතු කළ යුතුය.

**03.** ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව විශ්‍රාමිකයන්ට දැනට ගෙවනු ලබන රු. 2500/- ක මාසික අන්තර් දීමනාවට අමතරව 2015 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි තවත් රු. 1000/- ක් දීමනාවක් ලෙස ගෙවිය යුතුය.

**04.** මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කරනු ලැබේ.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය